# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,434—1962 දෙසැම්බර් 14 වැනි සිකුරාද—1962.12.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1770 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1767 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1767 | ශ්‍රී ලඞකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1768 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1769 | ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1771 |
| | | "පුරාබද්ධ ආඥපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


[සැලකිය යුතුයි.—මේවර ප්‍රසිඞ කරනු ලබන ගැසට් පත්‍රයේ vi වෙනි කොටසේ උප්පැන්න, මරණ සහ විවාහ ලේකම්වරුන්ගේ නාම ලේඛනය පලවේ.]

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 512

අංකය : ඞී. 42/රෙක්ට්.

**නිලධාරීන්ගේ පත් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවේ පහත සඳහන් පත් කිරීම අනුමත කර තිබේ :—

1962 නොවැම්බර් මස 15 වැනි දින සිට රා. ව. ලං. තිස්ස නෞකාවේ අණදෙන නිලධාරි වශයෙන්—

ලයිතන් කොමාන්ඩර් ඒ. ඩබ්ලිව්. එච්. පෙරේරා, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෘ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 දෙසැම්බර් 5 වෙනිදා,
කොළඹ දීය.

12-487

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 513

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය :—

ඒ. 271/62.

1962 සැප්තැම්බර් මස 10 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඩී. සමරකෝන් මහතා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පාලක නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 326/62.

1962 ඔක්තෝබර් මස 23 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඩබ්ලිව්. බී. සී. සෙනරත් නන්දදේව මහතා ආනයන හා අපනයන නියෝජ්‍ය පාලක ලෙස වැඩ බැලීමට.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
නැ. පෙ. 500.

12-570

## විශෙෂ නිවේදනයයි

1962 දෙසැම්බර් මස 25 වෙනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1962 දෙසැම්බර් 28 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 දෙසැම්බර් 22 වැනි සෙනසුරාදා දවල් 12ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඞ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 දෙසැම්බර් 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 514**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 20/48.

ඒ. ඩී. ජේ. ගුණවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 දෙසැම්බර් මස 15 වැනි දින සිට ගම්පහ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 66190/ඒ දරණ නඩුව අසා අවසාන කිරීමට සහ තීන්දුව දීමට ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්/68සී/51.

සී. වී. උඳලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 දෙසැම්බර් මස 6 වැනි දින සිට 8 වැනි දින දක්වා සහ නැවතත් 1962 දෙසැම්බර් මස 11 වැනි සහ 12 වැනි දිනයන්හි අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරම සහ වවුනියා අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 35 බී/61

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 දෙසැම්බර් මස 17 වැනි දින සිට 22 වැනි දින දක්වා කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 37 ඒ 55.

පී. මාරපන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එච්. උඳලාගම මහතා 1962 දෙසැම්බර් මස 7 වැනි දින කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 16 ඒ/59.

ඩී. ඊ. ධම්සේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 දෙසැම්බර් මස 5 වැනි දින සිට 8 වැනි දින දක්වා බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 41/ඒ/60.

එස්. සෙල්ලයියා සහ එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1962 දෙසැම්බර් මස 10 වැනි දින හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්/66 ඒ/54 (II)

සී. තනබාලසිංහම් මහතා නැවත වැඩ බාරගන්නා තෙක් හෝ නැවත නියමයක් කරනතුරු, ටී. මුතුසාමිපිල්ලේ මහතා 1962 දෙසැම්බර් මස 3 වැනි දින සිට යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ යාපනයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 6/48.

ඒ. ඊ. ආර්. කොරයා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. ජී. ද සිල්වා මහතා 1962 දෙසැම්බර් මස 7 වැනි දින අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 29/බී/61.

එස්. ඩී. ජයසුන්දර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 දෙසැම්බර් මස 7 වැනි දින තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, සහ හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 42ඩී/61.

ඩී. එස්. නෙත්සිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. එම්. තාහිර් මහතා 1962 දෙසැම්බර් මස 6 වැනි සහ 7 වැනි දිනයන්හි ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැවත වැඩ බාරගන්නා තෙක් හෝ නැවත නියමයක් කරනතුරු එස්. පී. විජයතිලක මහතා 1962 දෙසැම්බර් මස 4 වැනි දින සිට මාතලේ ක්‍රියා කරන පිණිස මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්/29සී/61.

එම්. ජමීල් මහතා නැවත වැඩ බාරගන්නා තෙක් හෝ නැවත නියමයක් කරනතුරු, එන්. ජේ. වී. කුරේ මහතා 1962 දෙසැම්බර් මස 4 වැනි දින සිට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1962 දෙසැම්බර් මස 3 වැනි දින සිට 5 වැනි දින දක්වා මන්නාරම අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ මන්නාරම අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේආර්එම්. 4/53.

එස්. පී. රාජරත්නම් මහතා 1962 දෙසැම්බර් 3 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් සහ තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයට.

අංකය : ජේආර්එම්. 4/53.

ජේ. පැට්රික් මහතා 1962 දෙසැම්බර් 3 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, යාපන දිස්ත්‍රික්කයේ දූපත් සහ බටහිර වලිකාමම් ගම්බද උසාවි සභාපති ධුරයට.

අංකය : සී/ජේආර්ඒ. 2/62.

කේ. සන්මුගනාදන් මහතා 1962 දෙසැම්බර් 3 වැනි දින සිට, දිවයිනේ ගම්බද උසාවි සභාපතිවරයකු වශයෙන් හා 1962 දෙසැම්බර් 3 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ පනාමා පත්තුවේ සහ අක්කරෙයි පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයට.

අංකය : පීඑල්. එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1962 දෙසැම්බර් මස 3 වැනි සහ 4 වැනි දිනයන්හි මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 8/61.

ඒ. අලගසියා මහතා නැති අතර එස්. ඒ. සී. එම්. මීර සයිබෝ මහතා 1962 නොවැම්බර් මස 30 වැනි දින මඩකලපු දිස්ත්‍රික්කයේ කරවකු, නින්තාවූර්, සමන්තුරේ සහ වැව්ගම් පත්තුවල ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 10/62.

සී. ජී. එල්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. වික්‍රමතුංග මහතා 1962 දෙසැම්බර් මස 19 වැනි, දින සිට 21 වැනි දින දක්වා, 24 වැනි දින, 26 වැනි දින සිට 29 වැනි දින දක්වා සහ 31 වැනි දින වැල්ලබොඩ පත්තුවේ, කඩවත් සතරේ සහ වැලිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ මාතර දිස්ත්‍රික්කයේ ගඟබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජී. 2/50.

ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. එල්. අබේරත්න මහතා 1962 දෙසැම්බර් මස 13 වෙනි දින සිට 15 වෙනි දින දක්වා සහ 17 වෙනි දින සිට 19 වෙනි දින දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් සහ කොලොන්නා කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එච්. සිරිවර්ධන මහතා 1962 දෙසැම්බර් මස 7 වෙනි සහ 8 වෙනි දිනයන්හි අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරලේ සහ පාතබුලත්ගම සහ අතුළුගම් සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා බෙලිගල් සහ කුරුවිටි කෝරලයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 දෙසැම්බර් මස 6 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

12-483

## වෙනත් පත්කිරීම් ආදිය

1962 අංක 515

### ගැසට් නිවේදනයයි

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : ඒ. අයි. 17/1/56.

1962 නොවැම්බර් මස 18 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරනතුරු බදුලු දිස්ත්‍රික්කයේ වැගම් පත්තු කෝරලයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. ඇම්. පී. බණ්ඩා මහතා ද,

අංකය : ඒ. අයි. 17/4/51.

1962 ඔක්තෝබර් මස 23 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරනතුරු මොනරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. පී. ඩබ්ලිව්. බස්නායක මහතා ද,

අංකය : අයි. එන්. කියු./එල්. 11/1/57.

1962 දෙසැම්බර් මස 2 වෙනි දින සිට එන්. එම්. අහමඩ් ලෙව්වයි මහතා නැවත වැඩ භාර ගන්නාතුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ වෙප්පන් කුලම් පී. පී. පොව්කෙනි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. නයිනා මොහමදු මහතා ද,

පත්කර ඇත්තේය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන
ස්ථිර ලේකම්.

1962 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

12-581

---

1962 අංක 516

අංකය : ඩී. 32/රෙක්ට්.

### රාජකීය ලංකා නාවික හමුදාව—නිලධාරීන් පත්කිරීම්

1962 අප්‍රේල් 28 වැනි දින සිට උප ලයිතන් (ඉ) හැටියට—

වැඩබලන උප ලයිතන් (ඉ) ඇම්. ඊ. ප්‍රිස්කින්, රා.ලං.නා.හ.
වැඩබලන උප ලයිතන් (ඉ) ඒ. එෆ්. අල්විස්, රා.ලං.නා.හ.

1962 අප්‍රේල් 28 වැනි දින සිට උප ලයිතන් හැටිය —

වැඩබලන උප ලයිතන් කේ. කේ. ප්‍රනාන්දු, රා.ලං.නා.හ.

ඇන්. කත්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 දෙසැම්බර් 2 වෙනිදා,
කොළඹ දී ය.

12-384/2

---

1962 අංක 517

අංකය : ඩී. 32/රෙක්ට්.

### රාජකීය ලංකා නාවික හමුදාව—නිලධාරීන්ගේ උසස් කිරීම්

1962 සැප්තැම්බර් මස 1 වැනි දින සිට වැඩබලන උප ලයිතන් (ඉ) හැටියට—

මිඩ්ෂිප්මන් (ඉ) ඊ. ජේ. පී. ද සිල්වා.

1962 සැප්තැම්බර් මස 1 වැනි දින සිට වැඩබලන උප ලයිතන් (එල්) හැටියට—

මිඩ්ෂිප්මන් (එල්) ආර්. අයි. සමරතුංග.

1962 සැප්තැම්බර් මස 1 වැනි දින සිට වැඩබලන උප ලයිතන් (ඉ) හැටියට—

මිඩ්ෂිප්මන් (ඉ) පී. ජේ. සැමුවෙල්.

ඇන්. කත්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 දෙසැම්බර් 2 වෙනිදා,
කොළඹ දී ය.

12-384/1

---

1962 අංක 518

අංකය : ඩී. 197/වීආර්.පී.

### රාජකීය ලංකා නාවික හමුදාව—නිලධාරීන්ගේ උසස් කිරීම්

1961 නොවැම්බර් 1 වැනි දින සිට වැඩ බලන උප ලයිතන් හැටියට—

මිඩ්ෂිප්මන් ඇෆ්. ඇන්. කත්‍යු. වික්‍රමරත්න, රා. ලං. නා. හ.

ඇන්. කත්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 දෙසැම්බර් 5 වෙනිදා,
කොළඹ දීය.

12-486

---

1962 අංක 519

මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ (115 වැනි පරිච්ඡේදයේ) 14 (1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් මාතර ක්වාසි විනිශ්චය මණ්ඩලයේ අංක 237 සහ 239 දරණ නඩු විභාගකොට තීරණය කරනුවස් මාතර 3 වැනි හරස් පාරේ අංක 22 දරණ ස්ථානයෙහි පදිංචි මොහමඩ් අමීන් බුහාරි මහතා මාතර අධිකරණ කොට්ඨාශයේ විශේෂ ක්වාසි හැටියට පත්කරන්ට යෙදුනා ඇත.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 නොවැම්බර් මස 21 දින,
කොළඹ දී ය.

12-423

---

1962 අංක 520

(115 වැනි පරිච්ඡේදයේ) මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ 12 (1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1962 දෙසැම්බර් මස 1 දින සිට 1965 දෙසැම්බර් 31 දින දක්වා අම්පාරේ දිස්ත්‍රික්කයේ අක්කරයිපත්තු ආදායම් කොට්ඨාශයේ ක්වාසි තනතුරට අක්කරයිපත්තුවේ අංක 4 කොට්ඨාශයේ මොහමඩ් ඉස්මායිල් මොහමඩ් මොහිඩීන් මහතා පත්කරන්ට යෙදුනා ඇත.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දීය.

12-382

---

1962 අංක 521

### දැන්වීමයි

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්, ග්‍රාම සංවර්ධන හා සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ, කේ. ජේ. සී. විජයවර්ධන මහතා, 1962 දෙසැම්බර් 6 වැනි දින සිට; ස්වකීය රාජකාරිවලට අතිරේකව, ආනයන හා අපනයන සහකාර පාලකවරයකු වශයෙන් පත් කරන ලදී.

කේ. අල්වාපිල්ලේ,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962. 12. 6 වැනි දින,
කොළඹ දී ය.

12-587

# ආණ්ඩුවේ නිවේදන

## බන්ධනාගාර ආඥාපනත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පනතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පනතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලයකට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඇස්. බී. කේ. තිලකරත්න,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශයේ සථිර ලේකම් වෙනුවට.

1962 දෙසැම්බර් මස 1 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු භාර අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| අනුරාධපුර බන්ධනාගාරය. | 1. එච්. ඒ. ජයවික්‍රම මහතා. |
| | 2. එච්. බී. තෙන්නකෝන් මහතා. |
| | 3. කේ. බී. කේ. තිලකරත්න මහතා. |
| | 4. කේ. එල්. සිරිබන්දු මහතා. |

12-338

---

## බන්ධනාගාර ආඥාපනත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තා, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලයකට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයෙකු වශයෙන්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඇස්. බී. කේ. තිලකරත්න,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 දෙසැම්බර් මස 6 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| අළුත්කඩේ බන්ධනාගාරය | ජේ. ඒ. පල්ලේගම මහතා |

12-449

---

## අබිං මණ්ඩලය—කුරුණෑගල දිස්ත්‍රික්කය

විෂ, අබිං සහ හානිකර බෙහෙත් ආඥා පනතේ (172 වෙනි පරිච්ඡේදය) 41 (2) වැනි වගන්තියේ බලතල අනුව සහ 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංශෝධනය කරන ලද ප්‍රකාශනය අනුව, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අබිං මණ්ඩලයේ සාමාජික ධුරයට ආයුර්වේද වෛද්‍යාචාර්ය ඇම්. ගුණදාස මහතා අද දින සිට ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත්කොට තිබෙන බව මෙයින් දැනුම් දෙමි.

එල්. එස්. බී. පෙරේරා,
සථිර ලේකම්.

1962 නොවැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

12-334

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පණත

### 21ඒ (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගයයි

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මට කලින් සිටි ඇමති තුමකු විසින් 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පනතේ 20 (1) වෙනි වගන්තිය යටතේ කරණ ලදින් 1959 පෙබරවාරි මස 28 වෙනිදා 11,687 වෙනි ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගය, මේ සමග ඇති උප ලේඛණයෙහි දක්වා ඇති දේපොලට සම්බන්ධ වන තරමින් 1961 කේ 22 වෙනි අංකය දරණ පණතෙන් සංශෝධිත 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පණතේ 21(ඒ) (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මේ නියෝගයෙන්, 1962 දෙසැම්බර් මස 15 වෙනිදා සිට, අවලංගු කරමි.

ඇම්. පී. ද ඉසැඩ් සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ
අමාත්‍ය තැන.

1962 දෙසැම්බර් මස 5 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| දේපොළ | පිහිටීම හා සෙසු විස්තර |
|---|---|
| **සීමාසහිත පානදුර මෝටර් ට්‍රාන්සිට් සමාගම විසින් පාවිච්චි කරන ලද දේපොළ** | |
| විවෘත මඩු තුනක් ඇතුළු ගුළුගහ වත්ත හා ගොරකගහවත්ත නැමැති ඉඩම. | පානදුර, ග්‍රැවිස් පාරේ පිහිටි, වරිපනම් අංක 57/1, දරණ ස්ථානය. |

12-506

---

ඇල්.ඞී.—බී. 16/54.

## සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත

වර්ෂ 1957 අංක 60 දරන පනතින් සංශොධිත (129 වැනි පරිච්ඡේදය වන) සාප්පු සහ කායර්ාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 7 වන වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලය පිට කම්කරු හා ජනසතු සේවා ඇමතිවර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, (177 වැනි පරිච්ඡේදය වන) නිවාඩු ආඥාපනත යටතේ ආණ්ඩුවේ නිවාඩු දින වශයෙන් සැලකෙන්නා වූ ද මෙයට යාකොට ඇති උපලේඛනයෙහි සඳහන්කොට ඇත්තා වූ ද දවස් ඉහත කී වගන්තියේ කාර්යයන් සඳහා නිවාඩු දවස් හැටියට මෙම ආඥාවෙන් ප්‍රකාශ කරමි.

ඇම්. පී. ද ඉසැඞ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා ඇමති.

1962 දෙසැම්බර් මස 7 වන දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. පොසොන් පුණු පොහෝ දිනය වන 1963 ජුනි 6 වැනි දින.
2. බණ්ඩාරනායක අනුස්මරණ දිනය වන 1963 සැප්තැම්බර් මස 26 වැනි දින.

12-533

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

### අංක 72 දරණ මුල්කිරිගල මැතිවරණ කොට්ඨාශය

ගම් සභා ආඥා පණතේ (257 වෙනි පරිච්ඡෙදය) 11 වෙනි වගන්තිය (දැනට 8 වෙනි වගන්තිය) යටතේ 1961 ජුලි 28 දින හා අංක 12,562 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ගරු පළාත් පාලන හා නිවාස ඇමති තුමාගේ නියෝගයේ හේතුවෙන්, 1961 නොවැම්බර් මස 14 දින හා අංක 12,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 10(3) වෙනි වගන්තිය යටතේ ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශයේ '' අයි '' අක්ෂරය දරණ ඡන්දදායක දිස්ත්‍රික්කය සඳහා ප්‍රකාශයට පත් කළ දැන්වීමේ උප ලේඛනයේ සඳහන් විස්තර වෙනුවට පහත සඳහන් උප ලේඛනයේ සඳහන් විස්තර ඇතුළත් කළ යුතු බව සියළු දෙනාටම දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. කේ. චන්ද්‍රානන්ද,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන,
අංක 72 දරණ මුල්කිරිගල මැතිවරණ කොට්ඨාශය.

කච්චේරිය,
හම්බන්තොට.
1962 දෙසැම්බර් මස 3 වෙනි දින දී ය.

### උපලේඛනය

| ඡන්දදයක දිස්ත්‍රික්කය | නියමිත අක්ෂරය හෝ අක්ෂර | ඡන්දය විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවනු ලබන ප්‍රදේශය |
|---|---|---|
| බටහිර ගිරුවා පත්තුවේ බෝවල ගම් මුලාදැනි කොට්ඨාශයට අයත් බෝවල-පහළගොඩ, බෝවල-පාළුගොඩ, ඇත්පිටියගොඩ හා නෙරළුවගොඩ ද යන ගම් වලින් යුක්ත වූ වලස්මුල්ල ගම් සභා ප්‍රදේශයේ අංක 2 දරණ කොට්ඨාශය හා, බෝවල ගම් මුලාදැනි කොට්ඨාශයට අයත් මුරුතවෙල-ඉහළගොඩ, මුරුතවෙල-පහළගොඩ, බෝවල-ඉහළගොඩ සහ හිඳකැටිගොඩ ද යන ගම් වලින් යුක්ත වූ වලස්මුල්ල ගම් සභා ප්‍රදේශයේ අංක 27 දරණ කොට්ඨාශය. | අයි ... | වලස්මුල්ල ගම් සභාවේ අංක 2 දරණ කොට්ඨාශය |

12–388 (1773 වෙනි පිට හා සම්බන්ධයි.)

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### ප්‍රකාශනයයි

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මැද පත්තුවේ ගවයින් අතර "රක්තාශ්‍රව'' නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : මහවැලි ගඟේ අංශයක් සහ කොට්ටියාර් පත්තුවේ මායිම; දකුණට : වස්ගමු ඔය; නැගෙනහිරට : මහවැලි ගඟ; බස්නාහිරට : සිංහල පත්තුවේ මායිම.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද ''සතුන්ගේ බෝවෙන රෝග'' පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යනුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර පොළොන්නරුව පශු වෛද්‍ය තැනගෙන් හෝ තමන්කඩුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 නොවැම්බර 30 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිගේ
කාර්යාලයේ දී ය.

12-369

---

### ප්‍රකාශනයයි

බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පොල්ගස්විට, පිලාවෙල, වැතර, සියඹලාගොඩ සහ කහටදූහ ගම්පති කොට්ඨාශවල ගවයින් අතර "මුව සහ කුර'' නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : හන්ගොවිල; දකුණට : පලාගම; නැගෙනහිරට : වෙනිවැල් කැලේ; බස්නාහිරට : හල්විට.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද ''සතුන්ගේ බෝවෙන රෝග'' පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යනුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර පිළියන්දල පශු වෛද්‍ය තැනගෙන් හෝ සල්පිටි කෝරළේ කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 නොවැම්බර 30 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිගේ
කාර්යාලයේ දී ය.

12-368

---

## අංක 58/62 දරණ ආනයන පාලන දැන්වීම්

### ප්‍රාරම්භක ආනයන වෙන්කිරීම්—1963

1963 සඳහා වූ ආනයන පංගු ලේඛන ගත කිරීමේ පරිපාටිය යථා කාලයෙහිදීම නිවේදනය කරනු ලැබේ. මේ අතරතුරේදී මෙම දැන්වීමේ ඒ. අක්ෂරය දරණ උපලේඛනයේ ලැයිස්තු ගත "පංගු අංක'' සඳහා වූ ආනයනකයින් ගේ 1963 ආනයන වෙන්කිරීම් එල්ලේ ඔවුන්ට අභිගමන පංගු දීමට යෝජනා වී ඇත.

2. මෙම ආනයන වෙන්කිරීමේ පරිපාටිය නිමිති කර ගෙන පහත දැක්වෙන පරිදි ආනයන වර්ග කරනු ලැබේ :—

(i) සාමාන්‍ය වෙළෙඳ අරමුණු සඳහා බඩු ආනයනය කරන්නා වූ ස්ථාපිත ආනයනකයින් විසින් කරනු ලබන ආනයන (බී උපලේඛනයේ i ආකෘතිය අනුව)

(ii) "සැබෑ පරිහරණකාර'' පදනමක් මත කෙරෙන කාර්මික අමු ද්‍රව්‍ය යනාදී ආනයන "සැබෑ පරිහරණකාර—ආනයනක'' යන්නේ අර්ථ නිරූපනය වන්නේ කාර්මික ප්‍රොසෙස් කිරීමෙක්හි ලා පරිහරණය සඳහා වූ අමු ද්‍රව්‍යවල සහ සහායක (ඇක්සෙසරීස්) වල ස්වකීය අවශ්‍යතා ආනයනය කර ගන්නෙකු අදහස් කෙරෙන සේය. (බී උපලේඛනයේ ii ආකෘතිය අනුව)

(iii) පෞද්ගලික හෝ වාණිජ නොවන අරමුණු සඳහා වූ වෙනත් ආනයන තුදෙක් ස්වකීය පරිහරණය සඳහා ම විනා පිට නොවිකිණීම පිණිස බඩු ආනයනය කර ගන්නා (සැබෑ පරිහරණකාරයින් හැර) රජයේ නීතිගත සංස්ථා ඇතුළු ආනයනකයින් හට බී උපලේඛනයේ iii ආකෘතිය අදාල වේ.

3. එහෙයින් මෙම දැන්වීමේ බී උපලේඛනයේ නියමිත ආකෘතියෙන් ස්වකීය ආනයන පිළිබඳ වූ සහතික කරන ලද "ප්‍රකාශ" මෙම පාලනය වෙත ඉදිරිපත් කරන සේ ආනයකයින් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. **උපලේඛනයේ ලැයිස්තු ගත හැම "පංගු අංකයක්" සම්බන්ධයෙන් ම වෙන වෙනම ප්‍රකාශ සැපයිය යුතුය.**

4. ආනයනක ගේ ප්‍රකාශය අයිතිකාරයා, හවුල්කාරයා හෝ වෙළඳ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් නැතහොත් වෙළෙඳ සමාගම වෙනුවෙන් යම් නීත්‍යනුකූල ප්‍රකාශයක් අත්සන් කිරීමට විධිමත් පරිදි බලය ලත් වෙන යම් පුද්ගලයෙකු විසින් හෝ අත්සන් කළ යුතුය.

5. මෙම අභිගමන ආනයන පංගු දීමට යෝජනා වී තිබෙන්නේ ආනයන ලියවිලි අවසාන සියුම් පරීක්ෂණයකට භාජනය කිරීමේ අපේක්ෂාවෙනි. එහෙයින් 1961 ස්වකීය ගනුදෙනුවලට අදාල සියලු ම ආනයන ලියවිලි සූදානමේ තබා ගෙන සිටින ලෙස ආනයනකයින්ට උපදෙස් දෙනු ලැබේ.

6. ස්වකීය ප්‍රකාශ ආකෘති "අංක 58/62 ආ. පා. දැන්වීම"යි සලකුණු කරනු ලැබ ලේඛන ගත ආවරණය (ලි. ප. -තැපෑලෙන්) යටතේ 1963 ජනවාරි 15 දාට පෙර පිටපත් දෙකකින් මෙම කාර්යාලයට ඉදිරිපත් කරන ලෙස ආනයනකයින් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

7. අංක 56/62 ආනයන පාලන දැන්වීම—ආනයනකයින් ලේඛන ගත කිරීම පිළිබඳ අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියා කර නොමැතියවුන් හට යම් අභිගමන ආනයන පංගුවක් දීමට අදහස් කරනු නොලැබේ. (සැබෑ පරිහරණකාරයින් ලේඛන ගත කිරීම සඳහා වූ පරිපාටියක් නොබෝ දිනකින් නිවේදනය කරනු ලැබේ.)

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 දෙසැම්බර් 5 කොළඹ.

## ඒ උපලේඛනය

### පංගු අංක

(හැම පංගු අංකයක් එල්ලේම රේගු වර්ගීකරණ වෙළෙඳ ද්‍රව්‍ය ගණ නොම්මරය දැක්වෙනුයේ හුදු සඳහන් කිරීමක් වශයෙන් පමණකි).

1. මද්‍යසාර සහිත බීම වර්ග—(112)
2. ලී සහ ලඹර—(242) ලී නිෂ්පාදන හැර
3. අකාබනික රසායන ද්‍රව්‍ය—(511)
4. කාබනික රසායන ද්‍රව්‍ය—(512)
5. ගල් අඟුරු, ඛණිජ තෙල්, ස්වාභාවික වායු යන මේවායෙන් වූ ඛණිජතාර සහ දළ රසායනික ද්‍රව්‍ය—(521)
6. මූලික ආකෘතියෙන් වූ සංශ්ලේශක (සින්තෙටික්) සුවිකාර්ය (ප්ලාස්ටික්) ද්‍රව්‍ය—(599)
7. කෘමිනාශක, දිලීර නාශක, විෂබීජ නාශක සහ සමාන නිෂ්පාදන (599)
8. විවිධ රසායනික ද්‍රව්‍ය සහ නිෂ්පාදන—(599)
9. ගල් අඟුරු තාර, රංජක ද්‍රව්‍ය සහ ස්වභාවික නිල්—(531)
10. ඩිස්ටැම්පර සහ පාට කිරීමේ ද්‍රව්‍ය, ගල් අඟුරු මූලික නොවූ—(533)
11. මුද්‍රණ තීන්ත —(533)
12. පිළියෙල කළ පින්තාරු තීන්ත, ඇනමල්, ලාක්ෂා, වාර්නිෂ්, සිත්තාරුකාරයින්ගේ පාටවර්ග සහ සිත්තරුන්ගේ පාට වර්ග—(533)
13. තේ සහ වෙනත් පෙට්ටි, වැද්දුම් (ලෝහමය හැර) සහ තුනී ලෑලි—(632)
14. පුවත්පත් කඩදාසි—(641)
15. කඩදාසි සහ කඩදාසි බෝඩ්—(641) (අහකයන සහ පරණ කඩදාසි හැර)
16. මෝටර් රථ සඳහා වූ හුළං ටයර සහ ටියුබ—(629)
17. ලොරි, බස්, ට්‍රක් සඳහා වූ හුළං ටයර සහ ටියුබ—(629)
18. මෝටර් සයිකල සහ ඉස්කූටර සඳහා වූ හුළං ටයර සහ ටියුබ—(629)
19. මෝටර් රථ වාහන සඳහා වූ ටයර සහ ටියුබ—(අංක 16, 17 සහ 18 හැර) (629)
20. සම්මත වර්ගවල කොටන් ෆැබ්රික්ස්—යාරමාන පදනම උඩ විකුණන—(652)
21. සම්මත වර්ගවල (කපු නොවන) ෆැබ්රික්—යාරමාන පදනම උඩ විකුණන—(653)
22. ඡායාරූප ශිල්පයේ දී භාවිත කෙරෙන ඡායාරූපීය රසායනික ද්‍රව්‍ය සහ රසායනික නිෂ්පාදන—(862)
23. සිනමා චිත්‍ර ශිල්පීය පටල—එළිය නොකැවූ—(862)
24. පොත් සහ පත්‍රිකා—(892)
25. පුවත්පත් සහ වාර සඟරා—(892)
26. ක්‍රීඩා භාණ්ඩ—(899), 1962 ඔක්තෝබර් 10 දාට පෙර බලපත්‍ර යටතේ වූ බඩු හැර
27. කාර්, ලොරි, වෑන් සහ වැගන් සඳහා වූ අමතර කොටස්—(732)
28. මෝටර් සයිකල සහ ඉස්කූටර සඳහා අමතර කොටස්—(732)
29. වෙනත් මාර්ගික මෝටර් රථ වාහන සඳහා අමතර කොටස්—(732)
30. විදුලිය සඳහා වූ ආවරන කළ කේබල් කම්බි සහ කම්බි—(721)
31. රේඩියෝ අමතර කොටස්—පරිචාරය සහ අළුත් වැඩියාව සඳහා—(721)
32. සිමෙන්ති—(661)
33. වීදුරු—(664) වීදුරු බඩු හැර
34. මූලික ලෝහ—යකඩ සහ වානේ—(681)
35. මූලික ලෝහ—වෙනත්—(682-689)
36. යකඩ සහ වානේ නිෂ්පාදන—(699)
37. කෘෂිකාර්මික ආම්පන්න සහ ආවුද—(699)
38. වෙනත් ආම්පන්න සහ ආවුද—(699)
39. ප්‍රවාහනය සහ ගබඩා කිරීම සඳහා වූ ලෝහ භාජන—(699)
40. කාර්මික පරිහරණය සඳහා වූ (තේ පෙට්ටි සඳහා වූ වැද්දුම් ද (ඇතුළු) වෙනත් ලෝහ නිෂ්පාදන—(699)

## බී උපලේඛනය

### ආකෘතිය I

ආනයනකගේ ප්‍රකාශය

(1) පංගු අංකය—මෙම ගණයේ ඇතුලත් කර ඇති (රේගු වර්ගීකරණ වෙළෙඳ ද්‍රව්‍ය සංකේත නො. සහිතව) වෙළඳ ද්‍රව්‍යවල සම්පූර්ණ ලැයිස්තුව සහිත විස්තරය.

(2) ආනයන (1961)—(ඒ) මාසික පදනමක් උඩ (1961 ජනවාරි සිට දෙසැම්බර) උපලේඛන ගත ආනයනවල මී. ර. නැ. ගා. වටිනාකම (බී) 1961 මුළු ආනයන.

**(3) ආනයන (1962 ඔක්තෝබර 10 දාට පසුව ක්‍රියාවේ යෙදන ලද නෞකා ගත කිරීම්)**

(ඒ) ණයවර ලිපි එල්ලේ :
(බී) අත්‍යාවශ්‍යතා සහතික එල්ලේ ;
(සී) 1962 ඔක්තෝබර 10දාට පසුව නිකුත් කරන ලද යම් ආනයන බලපත්‍රයක් එල්ලේ ;
(ඩී) වෙනයම් ආනයන (නොඉ. ප්‍රකාශ ආනයන)
(ඊ) ඒ, බී, සී, ඩී යන මේවායේ මුළු වටිනාකම

**(4) අපේක්ෂිත වූ බඩු ඇණවුම් (මෙම ප්‍රකාශයේ දිනයේදී කරන්ට ඉතිරිව තිබෙන නොකා ගත කිරීම්)**

(ඒ) ණයවර ලිපි එල්ලේ ;
(බී) අත්‍යාවශ්‍යතා සහතික එල්ලේ ;
(සී) 1962 ඔක්තෝබර 10 දාටද පසුව නිකුත් කරන ආනයන බලපත්‍ර එල්ලේ ;
(ඩී) ඒ, බී, සී යන මේවායේ මුළු වටිනාකම.

මාගේIඅපගේ දැනීමේත් විශ්වාසයේත් ප්‍රකාර ඉහත සඳහන් ප්‍රකාශ සැබෑ බවත් නිවැරදි බවත් යම් අසත්‍ය ප්‍රකාශයකින් මා ගේ/අප ගේ 1963 ආනයන පංගු සහ අංක 56/62 ආනයන පාලන දැන්වීමේ දැක්වෙන පරිපාටිය යටතේ ආනයනකයෙකු වශයෙන් ඇති මා ගේ/අප ගේ ලේඛන ගත වීම අවලංගු කරනු ලැබීමට යටත් වන වග පිළිගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි/කරමු.

...................... අත්සන :...............................

දිනය : ආනයනකගේ නම සහ ලිපිනය :—

විස්තර සටහන :—මෙම ආකෘතිය ගැනෙනුයේ සාමාන්‍ය වෙළෙඳාම් අරමුණු උදෙසා බඩු ආනයනය කරන ස්ථාපිත ආනයනකයින් හටය. (3) සහ (4) කොටු නිමිත්තෙන් රෙදිපිළි සම්බන්ධයෙන් අදාල වන්නේ 1962 ජූලි 26 ය. සිමෙන්ති සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු (1) සහ (2) කොටුවලට අතිරේක වශයෙන් සැපයිය යුතුය.

(1) 1962 තුළ ආනයන.
(2) 1963 තුළ අපේක්ෂිත නෞකා ගත කිරීම්.
(3) අතේ තිබෙන තොග (ප්‍රමාණය සහ වටිනාකම)

### ආකෘතිය II

ආනයනකයගේ ප්‍රකාශය

(1) පංගු අංකය—මෙම ගණයේ ඇතුළත් කර ඇති (රේගු වර්ගී කරණ සංකේත නොම්මර සහිත) වෙළෙඳ ද්‍රව්‍යවල සම්පූර්ණ ලැයිස්තුවක් සහිත වූ විස්තරය.

(2) ලේඛනගත අංක (අනුමැතිය ලත් කර්මාන්තයක් නම්)

(3) 1961 තුළ වූ ආනයනවල මුළු ප්‍රමාණය සහ මි. ර. නැ. ගා. වටිනාකම

(4) 1963 දී විය යුතු ප්‍රේෂණවල මුළු ප්‍රමාණය සහ මි. ර. නැ. ගා. වටිනාකම

(ඒ) 1962 දී විවෘත කරන ලද ණයවර ලිපි එල්ලේ ;

(බී) 1962 දී නිකුත් කරනලද අත්‍යවශ්‍යතා සහතික එල්ලේ ;

(සී) 1962 දී නිකුත් කරන ලද වෙනත් ආනයන බලපත්‍ර ;

(ඩී) ඒ, බී, සී යන මේවායේ මුළු ගණන.

(5) 1962 දෙසැම්බර 31 දා අතේ වූ තොග (ප්‍රමාණය සහ වටිනාකම)

(6) 1963 තුළ දී අවශ්‍ය බඩුවල මුළු ප්‍රමාණය සහ මි.ර.නැ.ගා. වටිනාකම (ඉහත 4 (ඩී) ට අතිරේකව)

(7) ඉහත (6) ට උපස්ථම්භක හේතු සම්පූර්ණයෙන්

මා ගේ/අප ගේ දැනීමේත් විශ්වාසයේත් ප්‍රකාර ඉහත සඳහන් ප්‍රකාශ සැබෑ බවත් නිවැරදි බවත් යම් අසත්‍ය ප්‍රකාශයකින් 1963 සඳහා වූ මා ගේ/අප ගේ ආනයන පංගු අවලංගු කරනු ලැබීමට සහ ආණ්ඩුවෙන් නියම කරනු ලබන වෙනයම් දඬුවමකට යටත් වග පිළිගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි/කරමු.

..................... අත්සන :................................

දිනය : ආනයනකයගේ නම සහ ලිපිනය :—

විස්තර සටහන :—මෙම ආකෘතිය අදාල වන්නේ "සැබෑ පරිහරණ කාර" පදනම උඩ කෙරෙන කාර්මික අමු ද්‍රව්‍ය යනාදි ආනයන වලටය. "සැබෑ පරිහරණකාර ආනයනකයෝ" යම් කාර්මික ප්‍රොසෙස් කිරීමෙක් හි ලා පරිහරණය සඳහා වූ අමු ද්‍රව්‍යවල සහ සහායක (ඇක්සෙසරිස්) වල ස්වකීය අවශ්‍යතා ආනයනය කර ගන්නවුන් අදහස් කෙරෙන සේ අර්ථ නිරූපිතයහ. මෙම ආකෘතියේ අතිරේක පිටපතක් (කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ) සංවර්ධන අංශයේ අධ්‍යක්‍ෂ වෙත ලේඛන ගත ආවරණය යටතේ ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

### ආකෘතිය III

ආනයනකයගේ ප්‍රකාශය

(1) පංගු අංකය :—මෙම ගණයේ ඇතුළත් කර ඇති (රේගු වර්ගී කරණ සංකේත නොම්මර දැක්වෙන) වෙළෙඳ ද්‍රව්‍යවල සම්පූර්ණ ලැයිස්තුව සහිත විස්තරය.

(2) 1961 තුළ වූ ආනයනවල සම්පූර්ණ මි.ර.නැ.ගා. වටිනාකම

(3) 1962 තුළ වූ ආනයන වල සම්පූර්ණ මි.ර.නැ.ගා. වටිනාකම

(4) මෙම පාලනයෙන් බලය දුන් ආනයනය කිරීම් එල්ලේ 1963 දී විය යුතු නෞකා ගත කිරීම්වල මුළු වටිනාකම

(5) අතේ තිබෙන තොග (ප්‍රමාණය සහ වටිනාකම)

(6) 1963 තුළදී පරිහරණය සඳහා අවශ්‍ය (ඉහත 4 හැර) බඩුවල මුළු ප්‍රමාණය සහ මි.ර.නැ.ගා. වටිනාකම

(7) ඉහත (6) ට උපස්ථම්භක හේතු සම්පූර්ණයෙන්.

මා ගේ/අප ගේ දැනීමේත් විශ්වාසයේත් ප්‍රකාර ඉහත සඳහන් ප්‍රකාශ සැබෑ බවත් නිවැරදි බවත් යම් අසත්‍ය ප්‍රකාශයකින් 1963 සඳහා වූ මා ගේ/අප ගේ ආනයන පංගු සහ අංක 56/62 ආනයන පාලන දැන්වීමේ දැක්වෙන පරිපාටිය යටතේ ආනයනකයෙකු වශයෙන් වූ මා ගේ/අප ගේ ලේඛන ගත කිරීම අවලංගු කරනු ලැබීමට යටත් වග පිළිගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි/කරමු.

..................... අත්සන :................................

දිනය : ආනයනකයගේ නම සහ ලිපිනය :—

විස්තර සටහන—මෙම ආකෘතිය අදාල වන්නේ (කාර්මික අමු ද්‍රව්‍ය පිළිබඳ සැබෑ පරිහරණකාරයින් හැර) ස්වකීය පරිහරණය පිණිස විනා පිට විකිණීමට අරමුණු නොකරන ලද බඩු ආනයනය කරන්නන්ටය—ඉදින් එම ආනයනවල වාර්ෂික වටිනාකම රුපි. 5000 ඉක්මවයි නම්, එම ආනයනවල වාර්ෂික වටිනාකම රුපි. 15,000 අඩු නම් දේශීය ස්ථාපිත ආනයනකයින් මගින් ඒවා සපයා නොගන්නේ මන්දැයි ප්‍රකාශකයා හේතු පෙන්විය යුතුය.

12-536

---

## ලංකා දුම්රිය සේවය

### දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය දිවෙන ස්ථාන ප්‍රකෘතිමත් කිරීම

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ ගාල්ල සහ උනවටුන දුම්රිය ස්ථාන අතර සැ. 74 ද, 02 අසල ගාලු-උඩුගම මහා මාර්ගය වැටී ඇති ස්ථානය ප්‍රකෘතිමත් කිරීම පිණිස, දෙසැම්බර් 15 වැනි සෙනසුරාදා ප.ව. 6.00 සිට රාත්‍රි 9.00 දක්වා රථ වාහන ධාවනය වළකාලීම සඳහා මෙම හරස් මග අර්ධ වශයෙන් වසා තබන අතර 15 වැනි සෙනසුරාදා රාත්‍රි 10.00 සිට පසු දින උදේ 6.00 දක්වා සම්පූර්ණයෙන්ම වසා තබනු ලැබේ.

මේ කාලය තුළදී මෙම මාර්ගයේ රථ වාහන වෙනත් මාර්ගයන් ගෙන් ධාවනය කරවිය යුතුය.

12-330

---

# ආණ්ඩුවේ නිවේදන

(1771 වෙනි පිට හා සම්බන්ධයි)

ඇල්.ඩී—බී 7/58.

### 1958 අංක 1 දරන කුඹුරු පනත 2 (1) වෙනි වගන්තිය යටතේ ආඥාව

1958 අංක 30 දරන කුඹුරු (සංශෝධන) පනතින් හා 1961 අංක 61 දරන පනතින් සංශෝධිත 1958 අංක 1 දරන කුඹුරු පනතෙහි 2 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1958 අංක 1 දරන පනතේ 53 වන වගන්තිය හලාවත-පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වියයුතු දිනය වශයෙන් 1962 දෙසැම්බර් මස 15 වෙනි දිනය මේ ආඥාවෙන් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමති.

1962 දෙසැම්බර් මස 12 දින,
කොළඹ දීය.

12-624

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි